# ප්‍රතිභාව හා දිරිය

## සිරිමාන්න ගේ කතාව

විජයසිරි තිලකුමාර
බ්‍රිස්බේන්




අපි පුංචි කාලෙ හැම අම්ම තාත්ත කෙනෙක්ම උත්සාහ කලේ තම දරුවන්ව දොස්තර කෙනෙක් නැත්නම් ඉංජිනේරුවෙක් කරන්න. සිරිමාන්නගෙ තාත්තත් කලේ එහෙමමයි. ඒකට ඉතින් දෙමව්පියන්ට දොස් කියල වැඩක් නෑ. මොකද කලා උපාධිධාරීයෙකුට එකල සමාජෙ කිසිම පිලිගැනීමක් තිබුනෙ නෑ. දොස්තර කෙනෙක් නැත්නම් ඉංජිනේරුවෙක් නුනොත් දරුවකුගෙ අනාගතයට මොනව වෙයිද කියල දෙමව්පියන් තියා කලාවට අධිපති සරස්වතී දෙවියොවත් දන්නවද කියල සැකයි. අපේ දෙමව්පියන්ගේ පැවතුන ඒ මානසික තත්වය අදහාගත හැකි උවත් ඔස්ටේලියාවට සංක්‍රමණය වන පරපුර මෙහි උපදින දරුවනට දොස්තර කෙනෙක් නැත්නම් ඉංජිනේරුවෙක් වෙන්න කියල බලපාන්නෙ ඇයිද කියල නම් සිරිමාන්නට තේරුම් ගන්න අමාරුයි. මේ ගැන සිත සිතා ඉන්න මොහොතක සිරිමාන්නට ඔහුගේ අතීතය මතක් වුනා.

මේ යකාගෙ අතීතයෙන් අපට තියන වැඩේ මොකද්ද කියල හිතෙනව නම් මේ සටහන කියවීම මෙතනින්ම නැවැත්තුවත් කමක් නෑ. හැබැයි ඉතින් අතලොස්සක් පාඨකයන්ටවත් එයින් තමන්ගෙ ළමා කාලය මතක් කරගන්න හරි, උපහාස රසයක් ලබන්න හරි පුලුවන්නම් සිරිමාන්නගේ කාර්යය සාර්ථකය කියලයි සිරිමාන්නට හැඟෙන්නෙ.

සිරිමාන්න ප්‍රථම වරට කලාවට ගෑවිලාවත් තියන කාර්යයක් කලේ හතේ පන්තියෙදි. සිරිමාන්න ඒ කාලෙ ඉගෙන ගත්තෙ මාතර සාන්ත සර්වේශස් විද්‍යාලයෙ. ඔහුගේ සිංහළ ගුරුතුමා උනේ කුමාරණතුංග මුනිදාස හෙළ හවුලේ පතාක යෝදයෙක් වුන දි.වි.රීචඩ් ද සිල්වා මහතාය. එතුමා හැමදා ම පාසලට ආවෙ සම්පූර්ණ බටහිර ඇඳුමින් සැරසිලා. ඒත් කථා බහ කලේ හුදු හෙළයෙන්.

සිරිමාන්නලගෙ පන්තියට දවසක් දා ගුරුතුමා රචනයක් ලියන්න දුන්න මා දුටු සිහිනයක් කියන මාතෘකාව යටතේ. සිරිමාන්නගෙ රචනය ගැන පැහැදුන එතුමා එය ඉරිදා සිළුමිණ පත්තරයේ ළමා පිටුවට යවන්න යෝජනා කලා. ඔහුගේ රචනය පල නුනත් හොඳ රචනා එවූ නංගිලා මල්ලිලා ගෙ නම් ලැයිස්තුවෙ නම පලවුනා. ඔහුට ඇතිවූ සන්තෝෂය කියල නිම කරන්න බෑ (එතුමා අද හිටිය නම් සිකුරටම අහනව සන්තෝෂය කියන්නෙ උඩු තෝෂය වගේ එක්කද කියල). ඉතින් පුංචි සිරිමාන්න අම්මට කෙඳිරිගාල සත පහලොවක් ඉල්ලගෙන පත්තරයක් අරගෙන කඩේ මුදලාලිටත් ඔහුගේ නම පෙන්නල ගෙදර ඇවිත් තාත්තට පෙන්නුව.

තාත්ත එක සැරේටම කිව්වෙ ඔකෙන් ඇති වැඩේ මොකක්ද කියල. ඔහුට ඇතිවුන දුක කියන්න සිරිමාන්න වචන දන්නෙ නැහැ. ඔහු හිතුවෙ තාත්ත බොහොම සන්තෝෂ වෙලා ඔහුව වර්ණනා කරයි කියලයි. ඔහුට එදා තාත්තව තේරුම් ගන්න බැරි උනා. ඒත් තාත්ත හිතපු හැටි ඔහුට දැන්නම් හොඳට තේරෙනව. සාහිත්‍යය කරල කාටද පලක් වුනේ කියපු ලංකාවේ ධර්මිශ්ඨ සමාජයේ ගරු නිර්මාතෘ ජේ' ආර් ජයවර්ධන උතුමාණන් වහන්සේ මහ ඉහලින් අදහපු සිරිමාන්නගෙ තාත්තගෙ වදන් එතුමාණන් වහන්සේගෙ තරම් කපටිය කියල ඔහුට හිතෙන්නෙ නැහැ. තාත්ත බය වුනේ තමන්ගෙ දරුවගෙ අනාගතය ගැන විතරයි. ඒත් ලංකාවේ හොඳම පෞද්ගලික ඉංග්‍රීසි සාහිත්‍යය පුස්තකාලය හිමිව සිටියාය කියන උතුමාණන් වහන්සේට ඊට වඩා පුලුල් පරමාර්ථයක් තිබුන බව අද බිහිව ඇති උතුම් වූ ධර්මිශ්ඨ සමාජයෙන්ම වැටහෙනවා.

කොහොම හරි සිරිමාන්නගෙ කලාවට තිබූ උද්යෝගය මෙම සිද්ධියෙන් යටපත් උනත් සම්පූර්ණයෙන්ම මැරිල ගියාය කියල සිරිමාන්නට හිතෙන්නෙ නැහැ.

තාත්ත සිරිමාන්නගෙ කලා ප්‍රතිභාවට ධෛර්යයක් නොදුන්නට තාත්තට තිබූ කලා හැකියාව සිරිමාන්නට තාමත් මතකයි. වෙද මහත්තයකු වූ තාත්තා බෙහෙත් සාප්පුව වසා හැන්දෑවට ගෙදර ආවම බොරලැස්ගමුවේ පී එච් පෙරේරා ගේ බුදු ගුණ කවි හඬ නගා කියපු හැටි සිරිමාන්නට මතක විතරක් නෙවී තවම කට පාඩම්. සිරිමාන්නගෙ අයියත් විශ්ව විද්‍යාලයෙ ඉන්න කාලෙ සිංහළ භාෂාවට උපරිම ලකුණු ලබා සර් ඩී.බී ශිෂ්‍යත්වය ලබාගත් සාහිත්‍යයට දක්ෂ කෙනෙක්. එයා 70 මැතිවරණයේදි යූ. එන්.පී වේදිකාවල ලස්සණට කථා කලා. ඒ කථාවල කිසිම දේශපාලන හරයක් නොතිබුනත්, කවි පන්තියක් ලස්සණට ගායනා කරල කථා කලාම පාක්ෂිකයො බොහොම උද්යෝගිමත් උනා. අයියත් තරුණ කාලෙ ගෙදරදි හඬ නගා කියපු ශෘංගාරාත්මක කවි සිරිමාන්නට තවම කට පාඩම්. සමහර කවි වල කතෘ කවුද වත් සිරිමාන්න දන්නෙ නැහැ. ඔය ආකාරයෙන් තමාගෙ කලා රුචිය නොමැරී පැවතුනා කියලයි සිරිමාන්න හිතන්නෙ.

සිරිමාන්නට තමන්ගෙ ප්‍රථම ප්‍රේමවන්තිය හමුවුනේ තමන් උපන් ගමේදි. එයා ගමේ පාසලේ ඉගෙන ගත් සිරිමාන්නගෙ ඥාති සොයුරියකගෙ හොඳම යෙහෙලියක්. ඇය පාසලේ සාහිත්‍ය සමිතියේ ලස්සණට ගී ගයපු සිරිමාන්නට වඩා මාස කිහිපයකින් වැඩිමහල් ලස්සණ තරුණියක්. හැබැයි සිරිමාන්නලගෙ පවුලයි ඇයගෙ පවුලයි අතර තිබුනෙ අහසට පොලව වගේ වෙනසක්. වැඩවසම් සමාජයෙන් උරුම වුන ගතානුගතික උස් පහත් කම් අනුව මේ දෙදෙනා කොහොමටවත් ගැලපුනේ නැහැ. ඒත් තරුණ සිරිමාන්නගෙ බොලඳ සිතට සිතුනෙ රෝමියෝ ජුලියට් වගේ ආදරයක් කියලයි එයාලගෙ ආදරය. කොහො ම හරි කලා අංශයෙන් උසස් පෙල සමත් වුන සිරිමාන්නගෙ ආදරවන්තිය විශ්ව විද්‍යාලයට තේරුණා. ඒත් සිරිමාන්න තවම උසස් පෙල හදාරනව. දවසක් තම ඥාති සොයුරිය සමගින් සිරිමාන්න නැති අවස්ථාවක නිවසට පැමිණි ඇය සිරිමාන්නගෙ සමරු පොතේ ලියල ගොස් තිබුණ සාංකා නැති වාසණාවෙ මැදුරු මැවේවා ! හද විමන් ගැබේ සිතුවිලි කැන් මල් පැලඳේවා කියන කවි දෙපදය සිරිමාන්නට තවම මතකයි.

කාලය ගෙවී යද්දි සිරිමාන්නගෙ ආදරීයට තේරුණා මේක කෙරෙන මගුලක් නොවෙන බව. එයා කලේ සිරිමාන්නගෙ හොඳම යාලුවා එක්ක හාද වෙන එක. මුලදි ලැජ්ජාව නිසා ජිවිතය ගැන කලකිරුනට මේ සිද්ධිය සිරිමාන්න ගෙ ජීවිතයට අලුත් පන්නරයක් ලබා දුන්න.

සිරිමාන්න විශ්ව විද්‍යාලයට ගියාට පස්සෙ පලවන වසරෙ එයා ගෙ කාමරයෙ හිටපු යාලුවටත් සිරිමාන්නට වෙචච ඇබැද්දියම උනා. ඊට ටික කාලෙකට පස්සෙ ඒ යාලුවා පශ්චාත් උපාධියත් අසමත් උනා. මිනිහගෙ විසඳුම උනේ බෙල්ලෙ වැල දාගෙන මැරෙන එක. සිරිමාන්න එවැනි තීරණයකට නොපෙලඹුනේ එයා ජිවිතයට මුහුණ දෙන්න පන්නරය ලබපු නිසා ද නැත්නම් යාලුවට තරම්වත් ආත්ම ශක්තියක් නැති නිසාද කියල තේරුම් ගන්න සිරිමාන්නට අමාරුයි.

විශ්ව විද්‍යාලෙදි සිරිමාන්න කවි ලීව. ඒත් ඒව කාටවත් පෙන්නුවෙ නැත්තෙ අනෙක් අය හිනාවෙයි කියල බයට. දවසක් කලා අංශයෙ ඉගෙන ගත්ත මිතුරෙකුට සිරිමාන්න තමන්ගෙ හොඳම යයි සිතුන කවි පංතියක් පෙන්නුව. මිනිහ ගත් කටටම ඇහුවෙ මේවත් කවි ද කියල. සිරිමාන්න ඊට පස්සෙ තමන්ගෙ කවි කාටවත් පෙන්නුවෙ නැහැ. හැබැයි සිරිමාන්න ඇතුලු මිතුරු කැල විශ්ව විද්‍යාලයෙදි කවියෙන් ලියපු නොයෙක් කැලෑ පත්තර වලට සිරිමාන්න නොමසුරුව දායක වුනා. බොරුවට මාක්ස්වාදියො වගේ පෙන්න ගෙන හිටපු කණ්ඩායමට විරුද්ධව අපහාසාත්මක නමුත් උපහාසය පිරුණ කැලෑ පත්තර යක්කු නමින් විශ්ව විද්‍යාලය තුල දැන සිටි සිරිමාන්නලගෙ කණ්ඩායමෙ හැම ග්‍රීෂ්ම ඍතුව අවසානයෙදිම පිට කලා. සමහරු මේව කියවල කෝප උනා. සමහරු රස වින්ඳා. මේ කැලෑ පත්තර සෙල්ලම සිරිමාන්නගෙ කලා

*<u>ලගදි දවසක තමාගේ මුල්ම ආදරවන්තිය සමග සිරිමාන්නට කථාකරන්න අවස්ථාවක් ලැබුන. එයා කියනව එයා තවමත් සිරිමාන්නට ආදරෙයිලු. ඒත් කියනව මේ අත්මයෙදි එක්වෙන්න බැරි නිසා ලබන ආත්මය ගැනවත් හිතමු කියල.</u>*

රුචිය දිගටම පවත්ව ගන්න උදව් උනා කියලයි ඔහු හිතන්නෙ. කොහොම උනත් තරුණ කාලයෙ ඉවක් බවක් නැතුව ලියපු මේ කැලෑ පත්තර වලින් සමහරුනගේ සිත් රිදවීම ගැන දැන්නම් සිරිමාන්න කණගාටු වෙනව.

ලගදි දවසක තමාගේ මුල්ම ආදරවන්තිය සමග සිරිමාන්නට කථාකරන්න අවස්ථාවක් ලැබුන. එයා කියනව එයා තවමත් සිරිමාන්නට ආදරයලු. ඒත් කියනව මේ අත්මයෙදි එක්වෙන්න බැරි නිසා ලබන ආත්මය ගැනවත් හිතමු කියල. එයා සිරිමාන්නගෙ යාළුවා සමග යාලු වුනේ විශ්ව විද්‍යාලයෙ හිටපු හැම කෙනෙක්ම එයා සිරිමාන්න ගෙන් වෙන්වුනාට පසු කොන් කරන්න පටන් ගත් නිසාලු. ලබන ආත්මයක් ගැන විශ්වාස නොකරන භෞතික වාදියෙක් වන සිරිමාන්නට මේ කථාවල කිසිම හරයක් අගයක් හෝ වටිනාකමක් නැහැ. ඒත් පරණ ආදරවන්තිය එක්තරා රටක ඉඳගෙන කිසියම් මාධ්‍යයක් හරහා ජිවිතය ගැන දුක් අඳෝනා දෙන කවි කථා විකාශණය කිරීම නම් සිරිමාන්නගෙ හිතට වදයක් නොවේයයි කියන්නත් බැහැ.

ලංකාවෙ හිටිය නම් සිරිමාන්න දැන් පැන්ෂන් කාරයෙක්. ඔස්ට්‍රේලියාවෙ හින්ද තාම වැඩ කරනව. සිරිමාන්නට තම අතීතය ගැන හිතුවම වෙලාවකට කලකිරීමක් ඇති වෙනව. කාලයක් හැම තරුණියක් දිහාම ඔහු බැලුවෙ ආත්මාර්ථකාමී අවස්ථාවාදී, අවසරයක් ලද වහාම වරදට පෙලඹෙන නරුම සමාජ කණ්ඩායමක සමාජිකයන් විදියටයි. ඒ නිසාම කිසිම තරුණියකව සිරිමාන්න විශ්වාස කලේ නැහැ.

විශ්ව විද්‍යාලයෙන් පිට වෙලා රස්සාවක් හොයන කාලෙ සිරිමාන්න ගෙදරට වෙලා ඉන්නකොට දවසක් මහ වැහි වහින්න පටන් ගත්තා. කම්මැලිකම ඉවසගන්න බැරිම තැන සිරිමාන්න මහ වැස්සෙම නුගේගොඩ හුලංගෙ කඩේට ගිහිල්ල ඉන්ඩියන් ඉන්ක් බෝතලයකුයි සුදුපාට බ්‍රිස්ටල් බෝර්ඩ් කීපයකුයි අරගෙන ගෙදර ඇවිල්ල චිත්‍ර අඳින්න පටන් ගත්ත. සිරිමාන්නගෙ ලොකු අයිය හිටපු චිත්‍ර ගුරුවරයෙක්. හැබයි සිරිමාන්න චිත්‍ර අඳින්න දන්නෙ නැහැ. සිරිමාන්න ගොඩක් ආදරය කරපු නවකථාවක් තිබුන "Moon & Six pence" කියල. ඒක ගෙතිල තිබුනෙ ප්‍රංශ චිත්‍ර ශිල්පී වෑන් ගොක් වටා. මෙම පොතේ මුල් පිටු කීපයකම තිබුනෙ වෑන් ගොක් ගෙ කලු සුදු චිත්‍ර කීපයක්. සිරිමාන්න මේව බලාගෙන ඉන්ඩියන් ඉන්ක් වලින් බ්‍රිස්ටල් බෝර්ඩ් වලට කොපි කලා. සිරිමාන්න ඔහුගේ මේ කොපි කරපු චිත්‍ර වලට ගොඩාක් ආදරය කලා. පස්සෙ දවසක මේ චිත්‍ර දැකපු සිරිමාන්නගෙ ලොකු අයිය ඒවායේ රේඛාවල කලාත්මක ගතිය ගැබ්වී නැති බව ප්‍රකාශ කලා. හැබැයි අර කවි විවේචනය කරපු යාලුව වගේ ලොකු අයිය නරුම උනේ නැහැ. ලොකු අයියගෙ විවේචනය නිර්මාණාත්මක එකක් වුන නිසා සිරිමාන්න එතරම් කලකිරුනෙ නැහැ. කොහොම නමුත් ඔහු ආයෙත් චිත්‍ර ඇන්දෙ නැහැ. ඔහු ආදරය කරපු චිත්‍ර ටික රෝල් කරල පොත් කබඩ් එක ඇතුලට දැම්ම.

කාලයත් සමග සිරිමාන්න කසාදයක් බැඳල තැන්පත් වුනා. අලුත් නිවසකට පදිංචියට ගියාට පස්සෙ සිරිමාන්නගෙ බිරිඳ දවසක් පොත් කබඩ් එක අස්කරන විට මේ චිත්‍ර දැකල ඒව කබඩ් එක හැඩි කරනව කියල වීසි කලාම සිරිමාන්න උපේක්ෂාවෙන් හිත හදාගත්ත. කසාද බැන්දට පස්සෙ සිරිමාන්න තම බිරිඳට දැඩිව ආදරය කලත් ඔවුනා දෙදෙනා අතරත් තිබූ යම් යම් නොගැලපීම්, නොවැටහීම් ආදිය නියාවෙන් හැල හැප්පිලි ඇතිවුනා. මේවා ඒ තරම් දුර දිග නොගියත් සිරිමාන්න අතින් තම බිරිඳට යම් යම් වැරදි සිදුවන්න හේතුභූත වුනා කියලයි සිරිමාන්නට හිතෙන්නෙ. මේ කාලය තුල සිරිමාන්න අතින් සිදු වූ වැරැද්දක් හේතු කරගෙන ලංකාවේ බලවත් දේශපාලකයකුගෙන් සිරිමාන්නට ලඟදී මරණ තර්ජනයක් මතුව ඇතත් සිරිමාන්නට ඇතිවන්නේ ඒ ගැන බියක් නොව තමා අතින් සිදු වූ වැරදි ගැන පසුතැවීමක් පමණයි. මැදහත් සිතින් නිස්කාන්සුවේ හිඳගෙන අතීතය ආවර්ජනය කරන සිරිමාන්නට කිසියම් ජීවන යතාර්ථයක් තේරුම් යන්නෙ ඉබේටම වගේ. ජීවිතයේ සිදුවුන හැම සිද්ධියකම වගේ සතුට, වේදනාව, සෙනෙහස, වෛරය, ආදරය, කරුණාව දයාව වැනි හැම මානුෂික හැඟීමක්ම ගැබ්වුන සංකීර්ණ හැඟීම් සමුදායක් ගැබ්වෙලා පවතිනව කියන එකයි ඒ යතාර්ථය.

තමා අතින් කිසිම දිනක වරදක් සිදු නොවූ අකලංක මිනිසුන් ලෙස පෙනී සිටින්නට තැත් කරන්නන් වංචනිකයන් ලෙසයි සිරිමාන්නට පෙනෙන්නෙ. තමා අතින් සිදුවූ වැරදි පිලිගැනීමට දැන් සිරිමාන්නට දිරිය තියෙනවා. ඒවාට සමාව දීම හෝ නොදීම සිරිමාන්නගේ කාර්යයක් නොවේ. කෙසේ වෙතත් තමා තුල සැඟවී ඇති ප්‍රතිභාවක් ඇතැයි සිරිමාන්නට සිතෙන්නේ ජිවිතය පුරා සිදුවූ සියලු ගැටීම් අනුභූතීන් කරගෙන කලාත්මක යමක් උත්පාදනය කිරීමෙන් තමාට තම අතීතය දෙස උපෙක්ෂාවෙන් බැලීමට හැකියයි හැඟෙන බැවිනුයි. ■